

# ගොවි සංවාදය

(එස්. එන්. දිසානායකගේ මනඃකල්පිත රචනයකි)

දිනය හා ස්ථානය—මාකඳුර පන්සලේ බන මඩුව (12.11.66)

මුලසුන: සංඝයා වහන්සේ

ප්‍රධාන අමුත්තෝ: කෘෂිකර්ම උපදේශක නිලධාරි, ආහාර නිෂ්පාදන ඕවර්සියර් මහතා කෘෂිකම් දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි මහතෙක්.

පැමිණ සිටි පිරිස: ගමේ ග්‍රාම සේවක, මුල්ගුරු, සමුපකාර සමිතියේ සභාපති, ගොවි කාරක සභාවේ සභාපති, තරුණ ගොවි සමාජයේ සභාපති, කුමතේරිස්, කරෝලිස් හා අමාරිස් ඇතුළු ගම්බද ගොවි පිරිස පන්සියයක් පමණ.

අරමුණ: බිත්තර වී පිළිබඳ සාකච්ඡාව (දේශපාලන අදහස් ප්‍රකාශ කිරීම සම්පූර්ණයෙන් තහනම්ය)

සංඝයා වහන්සේට ගිලන්පස හා පැමිණ සිටි පිරිසට සංග්‍රහය: තරුණ ගොවි සමාජය මගිනි.

වේලාව: පස්වරු 3.15 සියල්ලෝම පන්සිල් ගෙන වාඩි වෙති.

**මූලාසන :** ගොවි පිංවත්නි, අද අපේ ගමේ ගොවිතැන පිළිබඳව, පවත්වන දෙවන සාකච්ඡාවයි මේ. අදද ගියවාරයේ මෙන්ම පළාතේ කෘෂිකර්ම උපදේශක නිලධාරි මහතා හා පළාතේ ආ. නි. ඔවර්සියර් මහතාද අප කවදත් නුදුටු පර්යේෂණ නිලධාරි මහතෙක් ද අපට උපදෙස් දීමට පැමිණ සිටිනවා. තවද අපේ ගමේ ගොවිතැන ගැන උනන්දුවක් දක්වන අනිකුත් ප්‍රභූමහතුන් ඇතුළු විශාල ගොවි පිරිසකුත් පැමිණ සිටිනවා. මෙම සාකච්ඡා වාරවලට තමුන්නාන්සේලා පැමිණීමෙන් ගමේ පොදු උන්නතියට වැඩ කරන කාටත් මෙයින් විශාල ධෛර්යයක් ඇති වන බැව් නො අනුමානයි. තමුන්නාන්සේලා දන්නා පරිදි අද අපේ සාකච්ඡාව පැවැත්වෙන්නේ බිත්තර වී පිළිබඳවය. උණුසුම් වාද විවාදවලින් යුත් සාකච්ඡාවක් ඇරැඹීමට මම තමුන්නාන්සේලා සියළු දෙනාටම ආරාධනා කරනවා.

**ග්‍රා. සේ. :** මම කැමැතියි දැනගන්න මේ නුමුහුන් හෝ දෙපාර්තමේන්තුවෙන් දෙන දෙමුහුන් බිත්තර වී පාවිච්චි කිරීමට ගොවියන්ට අතිරේක වියදමක් කරන්න සිදු වෙනවාද. ඒ වගේම එම වී වගා කොට ඇති වගාවලට වැඩිපුර සාත්තු කරන්න සිදුවෙනවාද කියලා.

**කෘෂි. උ. :** මහත්වරුනි, මේ සභාවේ කව්රුවත් හිතන්න එපා මේ දෙපාර්තමේන්තුවෙන් දෙන උසස් බිත්තර වී වර්ගවල දිව්‍යමය නැත්නම් මැජික් බලයක් තිබෙනවා කියා. ඒ නිසා උසස් රෝපණ ක්‍රම නොහොත් වගා ක්‍රම ක්‍රියාවේ යෙදීමෙන් පමණයි ඉතා උසස් අස්වැන්නක් ලබා ගැනීමට පුළුවන් වන්නේ. එබැවින් උසස් වර්ගවලට උසස් රෝපන ක්‍රම ක්‍රියාවේ නොයෙදුවොත් නවීන ක්‍රම ක්‍රියාත්මක නොකොට වගා කළ ගම්බද වී වර්ගවලින් ලැබෙන අස්වැන්නවත් ලැබෙන්නේ නැහැ. වඩා හොඳ වගා ක්‍රම ක්‍රියාවේ යොදන්නැයි කීමෙන් මා බලාපොරොත්තු වන්නේ නෑ මේ ගොවි මහත්වරුන්ට නුපුරුදු නුහුරු ගොවිතැන් ක්‍රම ක්‍රියාවේ යොදන්නය කියා. මම තමුන්නාන්සේලාගෙන් ක්‍රියාවේ යොදන්න කියල ඉල්ලා සිටින්නේ ඔබලාට පුරුදු පුහුණු වෙච්ච ක්‍රමම වඩාත් ක්‍රමාණුකූලව විද්‍යාත්මක ක්‍රම අනුව කලට වේලාවට කරන්නෙ කියන එකයි.

**පර්යේෂණ නිලධාරි :** උසස් වර්ගවල වර්ණදේහයන් තුළ සහජ වශයෙන් ඇති විභව ශක්තිය පරිපූර්ණ ලෙස ප්‍රකාශ කිරීමට උසස් රෝපණ ක්‍රම මගින් වැඩිපුර පෝෂ්‍ය පදාර්ථ ආදිය ශාකයන් වෙත ලබා දී එමගින් පැළවලට උසස් අස්වැන්නක් දීමේ අවස්ථාවක් ලබා දිය යුතුමය.

**කෘ. උ. :** මම දන්නේ නැහැ. ඒක මේ ගොවි මහත්වරුන්ට තේරුණාද කියලා ඒ කියන්නේ, දෙපාතීමේන්තුවෙන් ලබා දෙන උසස් නුමුහුන් හා දෙමුහුන් වී වගී වලට උසස් අස්වැන්නක් ලබා දීමෙ බලයක් නැත්නම් හැකියාවක් සහජ වශයෙන්ම එම වී වගී තුළ සැඟවී තිබෙනවා. ඉතින් එම සැඟවුණු බලයට පණදීලා උසස් අස්වැන්නක් ලබා ගන්න නම් එම දෙමුහුන් හා නුමුහුන් වගීවලට වැඩියෙන් පොහොර එහෙම දාලා වඩා හොඳින් වගා කරන්න ඕනෑ කියන එකයි ඒ මහත්මයා ඒ කියන්නේ.

**ආ. නි. ඕ. :** කොටින්ම කියනවා නම් උසස් වගීවලින් උසස් අස්වැන්නක් ගන්න නම් වැඩියෙන් මහන්සි වෙලා වැඩියෙන් තව සුළු මුදලක් වියදම් කරල ඕනෑ වැඩි අස්වැන්නක් ගන්න. ඒ කියන්නේ කැවුම් රහ වෙන්න වැඩියෙන් කිතුල් පැණි එහෙම දාන්න එපායැ. (සභාව කුල්මත්වෙයි)

**කෘ. උ. :** නෑ, නෑ, එහෙම නොවේයි. සාමාන්‍ය ක්‍රමයට වඩා නවීන ක්‍රමයට යන වැඩි වියදම මෙන් තුන් හතර වාරයක් ලාභ ලැබෙනවා. මේක ඔය කැවුම් කනව වගේ ලේසි වැඩක් නොවෙයි. (සභාවෙන් සිනා)

**මූ. ශූ. :** මහත්මයලා මොකද ඔය නුමුහුන් හා දෙමුහුන් වී වර්ගවලට උසස් යයි කියලා කියන්නේ. ඇයි අපේ ගම්බද වී වර්ග උසස් නැද්ද ඒවා පහත් වුණේ කොහොමද කියල මට නම් තේරෙන්නෙ නැහැ. (ගැමියෝ මවිතයෙන් බලා සිටී)

**ආ. නි. ඕ. :** සෑම වී වර්ගයකටම ඊට අයිති නොයෙක් විධියේ ගති ගුන තිබෙනවා. සමහර වී වර්ග මිටියි ඒ නිසා ඇද වැටෙන්නේ නැහැ. සමහර වර්ග උසයි ඒ නිසා පහසුවෙන් ඇද වැටෙනවා. සමහර වර්ගවලින් ඇට පහසුවෙන්ම හැලී යනවා. එම වර්ග පැගීමට පහසු වුනාට අස්වැන්නේ භාගයක්ම සමහර විට කුඹුරේ හැලෙනවා. සමහර වර්ගවලින් ඇට පහසුවෙන් නොහැලෙන බැවින් පාගන්නත් අමාරුයි. සමහර වර්ග කරදියට ඔරොත්තු දෙනවා. අනෙකුත් වර්ග ලෙඩ රෝගවලට ඔරොත්තු දෙන අතර ගංවතුර ඔරොත්තු දෙන වර්ගද තිබෙනවා. ඒ වගේම වැඩියෙන් පොලොවෙන් පොහොර ඇද ගත හැකි, ඒ වගේම උසස් අස්වනු ලබා දිය හැකි, තවත් නොයෙකුත් වර්ග තිබෙනවා. තවත් සමහර වර්ගවල බත රසවත් මෙන්ම, වී බුසලකින් වැඩි සහල් ප්‍රමාණයක් ලබා ගත හැකි වර්ග තිබෙනවා.

**පර්. නි. :** මෙම ගතිගුණවලින් සමහරක් ප්‍රමුඛයි. සමහරක් නිලීනයි. ඒ අනුව උසස් ප්‍රමුඛ ගති ගුණ එක්රැස්කිරීම සඳහා වර්ග දෙමුහුන් කිරීම වැනි නවීන අභිජනන ක්‍රම මගින් වඩා උසස් වර්ග බෝකරනවා. ඉන් පසු ඒවා ගොවිපලවල දී අත්හදා බලා වැඩියෙන් අස්වැන්න ලබා දිය හැකි වර්ග මහජනයා වෙත නිකුත් කරනවා. එච්-4, එච්-7 හා එච්-8 එවැනි දෙමුහුන් උසස් වී වර්ගයි.

**ආ. නි. ඕ. :** එබැවින් අපේ අරමුණ විය යුත්තේ උසස් වර්ග පමණක් වගා කිරීමයි. උසස් නුමුහුන් හා දෙමුහුන් වර්ග එක විධියටම වගා වන බැවින් එක වරම පඳුරු ගසා, එකම වර පීදෙන බැවින්, මුළු යායේම අස්වැන්න කපා ගැනීමත්, එක වරම සිදු කළ හැකිය. එබැවින් වඩා පහසුවෙන් අස්වැන්න කෘමි උපද්‍රවවලින් බේරා ගන්නත් පුළුවන් වෙනවා.

**සමූ. සභා. :** ලංකාවේ තියෙන වී වර්ග සියල්ලම ඔය ඉහත කී විධියට බෝකරණ ලද ඒවාද ?

**පර්. නි. :** නෑ ! නෑ ! තවත් සමහර වර්ග පිටරටවලින් ගෙනැවිත් මේ රටට ගැලපේද කියා සෝදිසි කර බලනවා "රෙමජා" හා "සිගාඩිස්" යන වර්ග රටට ගැලපෙන ගැලපෙන එවැනි වර්ගයි. තවත් වර්ග දේශීය වර්ගවලින් උසස් ගති ගුණ අනුව තෝරා ගන්නවා "හීනටි" "දෙවරැද්දිරි" ආදිය එවැනි නුමුහුන් වර්ගයි. උසස් වර්ගයක් තෝරා ගත හැක්කේ වී වර්ග දහස් ගණනක් පිළිබඳ අත්හදා බැලීම් කිරීමෙනුයි.

**කුමතේරිස් :** වී වර්ග නම් හුඟක් තිබෙන බව නම් අපිත් දන්නවා. අපේ ගමේම ඔය තියෙන්නේ ගොනබරු, ඇල්වී, සුවඳැල්.

**ආමාරිස් :** සුවඳැල් හොඳයි නේද බං? බත පිහිනකොට කොච්චර සුවඳද? (සභාවෙන් හිනා)

**කෘ. උ. :** මේ වී වර්ගවල අර ආහාර නිෂ්පාදන ඕවර්සියර් මහත්මයා කිව්වා වාගේ නොයෙක් විධියේ ගතිගුණ තියෙනවා. සමහර ගතිගුණ හොඳ ඒවා. තවත් සමහර ඒවා වැදගැම්මකට නැති ඒවා. සුවඳැල්වල බත සුවඳ නිසා එය හොඳ වර්ගයක් කියූ, නමුත් ඒ ගොවි මහත්මයා අපට දැන්වූවොත් හොඳයි සුවඳැල් නමැති වර්ගයෙන් අක්කරයකින් කොපමණ අස්වැන්න ලැබෙනවාද කියලා.

**අමාරිස් :** බුසල් 30-35 ලැබෙනවා මහත්මයෝ, රට පෝර එහෙම හොඳට දැම්මහම.

කෘෂි. උ.: ඒ ගොවි මහත්මයා දැන් අපට දැන්වූ අස්වැන්න ඉතා පහත් මට්ටමක ඇති අස්වැන්නක්. එච්-4 නමැති වර්ගය අක්කරයක් බුසල් 160 තරම් වන උසස් අස්වැන්නක් ලබා දීමේ සහජ ශක්තියක් තිබෙනවා. එච්-8 වර්ගයෙන් වුවත් නවීන ක්‍රම යොදා වගා කරන වගාවකින් සාමාන්‍යයෙන් බුසල් 80ක තරම් වන අස්වැන්නක් ගැනීමට බැරි වන්නේ නැ. එතකොට බුසල් 30-35 තරම වන පහත් අස්වැන්නක් ලබාදෙන සුවඳැල් වැනි වර්ගයක් වගාකරනවාට වඩා හොඳ නැද්ද උසස් අස්වැන්නක් ලබා දෙන දෙමුහුන් වර්ගයක් වගා කරන එක. ඒ නිසා සුවඳැල් නමැති වී වර්ගයේ බතේ ඇති සුවඳ එම වර්ගයේ හොඳ ගතිගුණයක් වුනාට එම වර්ගයෙන් ලැබෙන සාමාන්‍ය පහත් අස්වැන්න එහි දුර්වල නරක ගති ගුණයක්. ඒ වාගේම ගම්බද වී වර්ගයක් වන සුවඳැල් පිදෙන්නේ එක එක වාරයට. එකවර පිදෙන්නේ නැ. එකවර පඳුරු ,ගහන්නේ නැ. ඒ නිසා එක පාරට කපා ගන්නත් බැ. අස්වැන්නත් අඩු වෙනවා. සමහර විට වී ටික සේරම මැස්සො බීලා යනවා.

ආ. නි. ඔ.: සුවඳ විතරක් තිබුණට මදිනේ. අපේ බඩ පිරෙන්නත් ඕනැ. සාක්කු පිරෙන්නත් ඕනැ. (සභාවෙන් හිනා)

ත.ගො. ස. සභාපති: ඔය දෙපාර්තමේන්තුවෙන් දෙන උසස් යයි සම්මත එච්-4 වී වර්ගය මම මේ පාර මගේ කුඹුරේ වගා කළා. කෝ ඒ වුනාට අස්වැන්න ලැබුණේ බුසල් 35යි නේ, ඉතින් මොකක්ද මහත්තයෝ ඇති පලේ. අපේ ගමේ වී වර්ගවලිනුත් ඔය ගානමනේ වෙනදත් ලැබෙන්නේ.

ආ. නි. ඔ.: හොඳයි මේ තරුණ ගොවි මහතා තමන්ගේ කුඹුරට කොපමණ රට පෝර දැම්මද?

සභාපති: බොරු කියන්නේ මොනවටෙයි. මම මේ දෙපාර්තමේන්තුවෙන් දාන්න කියලා කියන පෝර ප්‍රමාණයෙන් බාගයයි දැම්මේ. ඒ මොකද? මේ වැඩියෙන් පෝර දමලා ගොයම විශාලෙට වැඩිලා කොළ ගවරය හැදිලා, අස්වැන්න අඩුවෙයි කියලා.

කරෝලිස්: අපොයි මගේ ගෝනබරු ටික සම්පූර්ණයෙන්ම විනාශවෙලා ගියා ඔය රට පෝර දමලා. (සභාවෙන් සිනා)

කෘෂි. උ.: මේ ගොවි මහත්වරු තමන්ගේ බිත්තර වීවලට දිලීර නාශක බෙහෙත් යොදා විෂ බීජ විනාශ කර ගන්නවාද?

කරෝලිස්: අපොයි අපි ඒ ගැන අහලවත් නැනේ මහත්මයෝ.

කෘෂි. උ.: බිත්තර වීවල විෂබීජ විනාශ කිරීමට වතුර ගැළුමකට සෙරසාන් කුඩු අවුන්සයක් යොදා එම මිශ්‍රණය වී බුසල් දෙක හමාරකට යොදා ඉස්කෝප්පයකින් හොඳහැටි කලවම් කරන්න. මෙම බෙහෙත් වස නිසා ඇඟේ නැවරෙන්න දෙන්න එපා. දෙවැනි ක්‍රමය අනුව සෙරසාන් වෙට් රාත්තලක් වතුර ගැළුම් 100 ක දියකරගත් මිශ්‍රණය සුදුසුයි. බිත්තර වී හොණ්ඩරයක් නොහොත් වී බුසල් 2½ක විෂබීජ නැසීම සඳහා මෙම දියරයෙන් ගැලුම් 11ක් යොදා ගන්න. වී බුසල් 2½ක් ඇමූ ගෝනියක පැය 12ක් ගතවනතුරු බෙහෙත් දියරයේ ඔබා තබන්න. ඉන් පසු වේලීම සඳහා බිත්තර වී සෙවන ඇති තැනක අතුරා වියැලුණු පසු ඉසින්න.

ආ. නි. ඔ: කරෝලිස් ගොවි මහත්මයා මෙන්ම තරුණ ගොවි සමාජයේ සභාපති මහත්මයා කිව් කරුණු අපිත් පිළිගන්නවා. තරුණ ගොවි සමාජයේ සභාපති මහතා තමාගේ අත්දැකීම් උඩ කී කරුණු අපි පිළිගන්නවා. උසස් දෙමුහුන් වී වර්ගයකට අවශ්‍ය පමණ රසායන පොහොර නොදැමීම නිසා තරුණ ගොවි සමාජයේ



5—එච 135 (66/10)

සභාපති මහතාට අල්ප අස්වැන්නක් ලැබුණ අත්දම අපට පෙනෙනවා. ඒ වගේම උසස් අස්වැන්නක් ලබා දීමේ කිසිදු බලයක් නොමැති ගෝනබරු වැනි ගම්බද වී වර්ගයකට විශාල පොහොර ප්‍රමාණයක් දැම්මත් එම වී වර්ගයට රසායනික පොහොර වලින් නිසි ප්‍රයෝජන ගැනීමට බැරි වීම නිසා වී ඇට වෙනුවට, කොළ ගවරය සෑදී කරෝලිස් අයියාගේ වී අස්වැන්න අඩුවූ හැටි අපට පෙනෙනවා.

**ගො. කා. සභා. සභාපති :.** මගේ ගොවි කාරක සභා ප්‍රදේශයේ ගොවි මහත්වරු මේ පෙඩ්-වී. ඒ-8 කියල මස 6ක් ගතවෙන අළුත් වී වර්ගයක් මගෙන් ඉල්ලනවා මහත්මයලාට බැරිද ඒ වී වර්ගය අපේ මේ ප්‍රදේශයට ගෙන්වලා දෙන්න.

**කෘ. උ. :** මහත්මයාගේ ගොවි කාරක සභා ප්‍රදේශය පිහිටා තිබෙන්නේ මාතර දිස්ත්‍රික්කයේ. එබැවින් කුරුණෑගල දිස්ත්‍රික්කයට නිර්දේශ කර තිබෙන වී වර්ගයක් මෙම කොටසට ගෙනැවිත් දෙන්න බෑ. මහත්මයාගේ කොටසට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කරලා තියෙන්නේ එච්-4 හා එච්-501 කියන වගී මේ ප්‍රදේශයට ඉතා සුදුසු වර්ග තමයි ඒ නිර්දේශ කරලා තිබෙන්නේ.

**ශ්‍රා. ශේ. :** කෝ අපි දන්නේ නැනේ ඔහොම නිර්දේශයක් තිබෙන බව.

**ආ. නි. ඕ. :** මම දැක්ක 1966 සැප්තැම්බර් ගොවිකම් සඟරාවේ ඔය නිර්දේශ පත්‍රිකාව ප්‍රසිද්ධ කරලා තිබෙනවා. ඊටත් වඩා දෙපාර්තමේන්තුවෙන් දෙන වී වගාව පිළිබඳ කුඩා අත්පොතෙත් එය සඳහන් වී තිබෙනවා.

**පර්. නිල. :** තවත් මේ උසස් වී වර්ග දිගු කාලීන හා කෙටි කාලීන කියා වගාවට ගත වන කාලය අනුව වෙන් කරලා තිබෙනවා. දිගු කාලීන වී වර්ග මාස් 4 කට හෝ ඊට වඩා වැඩි කලක් ගත වන වර්ගයි. දිගු කාලීන වර්ග සාමාන්‍යයෙන් වගා කරන්නේ මාස් කන්නයටයි. කෙටි කාලීන වර්ග වගා කරන්නේ යල කන්නයටයි.

**කුමනේරිස් :** දිගු කාලීන වර්ගයක් යලට වගා කළොත් මොකද මහත්මයෝ ?

**කෘ. උ. :** සමහර විට එම වර්ගය පූදින්නේ නැතුව යන්න පුළුවන්. ඒ දිගු කාලීන වර්ගවලට දවසේ අඩු වැඩි වීම බලපාන නිසා සාමාන්‍යයෙන් පී. ජී. බී-16 නමැති වර්ගය මාස් කන්නයේ දී වැපිරිය යුත්තේ සැප්තැම්බර් මාසයේ දී පමණ. නුමුත් සමහර වර්ගවලට නම් දිවා කාලයෙහි බලපෑමක් නැති නිසා යලට මෙන්ම මහටත් වගා කරන්න පුළුවන්. එච්-4 එවැනි වර්ගයක්. නැතහොත් සමහර වර්ගවල පීදීම ප්‍රමාද වෙනවා. අනික් කාරණය නම් දිගු කාලීන වර්ග යල් කන්නයේදී වගා කළ විට වගාවට අවශ්‍ය සම්පූර්ණ ජල ප්‍රමාණය මඳ විය හැකි නිසා.

**මුල්ගුරු මහතා :** දැන් මේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් බිත්තර වී බුසලක් දෙන්නේ කීයටද ?

**ආ. නි. ඕ. :** රුපියල් දොලහයි. ගෝනියක් ඔබලා සපයන්න ඕනෑ. (සභාවෙන් හිනා)

**කුමනේරිස් :** අපි දන්නේ කොහොමද මහත්මයලා දෙන බිත්තර වී හොඳද නැද්ද කියලා ?

**ආ.නි.ඕ. :** එම බිත්තර වී ගෝනිවල සියේට 97ක් පරිශුද්ධතාවයක් ඇති බවටත්, සියයට 75 පැලවීමේ ශක්තියක් ඇති බවටත් සහතිකයක් අමුණා තිබෙනවා.

**අමාරිස් :** හොඳයි දෙපාර්තමේන්තුව දෙන බිත්තර වී පැළ නූනොත් අපි මොකද කරන්නේ ?

**කෘ. උ. :** මේ ගොවි මහත්වරු කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයෙන් වී මිළයට ගැනීමට ප්‍රථම තමන් මිළයට ගැනීමට අදහස් කරන වී ශෝනිවලින් වී ඇට 25-50ක් පමණ ගෙදර ගෙන ගොස් පැළ කරලා බලන්න. ඊට පසු වී පැළවෙන බවට තමන්ට සහතික නම් පමණක් එම වී මිළයට ගන්න. තවත් මේ බිත්තර වී ගමේ සමුපකාර සමිතියේ ගබඩා කර තබා එම සමිතිය මගින් අවශ්‍ය අයවළුන්ට බෙදා දෙන්න පුළුවන් නම් ඒක බොහොම හොඳ වැඩ පිළිවෙලක්, නැත්නම් ගොවිකාරක සභාව මගින්වුවත් බෙදාදෙන්න පුළුවන්.

**කැරෝලිස් :** කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් අපට මිළ කරණ බිත්තර වී නිපද වන්නේ කවුද කියා මම දැනගන්න සතුටුයි.

**ආ. නි. ඕ. :** අප ඔබලා වෙත ලබා දෙන බිත්තර වී පුද්ගලික බිත්තර වී ගොවිපළ වල නිපද වූ අවශ්‍ය මට්ටමට පැළවීමේ ශක්තිය හා පිරිසිදු බව ඇති බිත්තර වී තමයි. අපි දෙපාර්තමේන්තුවෙන් දැන් ලබා දෙන දෙමුහුන් වී වර්ග අතර එච්-4, එච්-8 හා එච්-7 තියෙනවා. අනිකුත් වර්ග දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශ කර ඇති ලැයිස්තුවේ සඳහන් වෙනවා.

**සංඝයා වහන්සේ (මූලසුන) :** දැන් රෑ බෝවෙන බව පේනවා. වේලාවත් දැන් 6.15යි. අද දින බිත්තර වී පිළිබඳ සෑහෙන සාකච්ඡාවක් අප අතර ඇති වුනා. නැවත කෘෂිකර්ම උපදේශක හා ආහාර නිෂ්පාදන ඕවර්සියර් මහත්වරු පෙබරවාරි මාසයේ අපේ රැස්වීමට පැමිණෙනවා ඇති. ඒ මහත්වරු අද දින පැමිණ අපට උපදෙස් දීම ගැන අපි බොහොම ස්තුතිවන්ත වෙනවා. තරුණ ගොවි සමාජය මගින් දැන් සියළු දෙනාටම සංග්‍රහයක් පවත්වනවා ඇත.

(සංග්‍රහයෙන් පසු) මූලසන—දැන් තරුණ ගොවි සාමාජිකාවක් හිටිවන කවිපෙලක් කියනව ඇති.

1. ගම්මුන් එකමුතුව — බඩ ගින්න දුන් නිවමුව
   ළමයින් නිවාඩුව — බසිනු සැමදෙනා කෙතට සතුටුව
2. වී නැලි දහස් ගණනින් — අටු කොටු පුරා කබමින්
   රස පොහොර යොදමින් — බසිනු කුඹුරට දනෝ සතුටින්
3. කර වැර වීරියේ — නිල් ගොයම සිත පිරියේ
   සිහළුනි දහිරියේ — මහිම පෙන්වව් අප ඉදිරියේ
4. ගොවිබිමෙන් ජයබිම — නංවා මව්බිමේ නම
   නංවා අපේ ගම — සිතනු "කුඹුරට දුන් බසිමි මම"
5. ගලා යන දිය රැලි — නවතමු දමා පස් වැලි
   නැතිව සිත කම්මැලි — කරමු ගොවිතැන් නගා හසරැලි
6. තමනට ආදරය — ඇතොත් තම රට ජාතිය
   ගෙදරට බත් හැලිය — දෙන්න මෙකයි හොඳම අවදිය
7. ඉතින් පාරවටූ — කිරි පැණි කෝලි කුවටූ
   අපේ තඹ තුවටූ — කොල්ලකාගති මෙතෙක් රවටූ
8. රටහාල් හෙව්වුව — නැතුවට මොකද ඔට්ටුව
   කුසගිනි තෙහෙට්ටුව — නිවයි කුරහන් ඉරිඟු පිට්ටුව

මූලසුන :— සභාවේ වැඩ හමාරයි. සියළුදෙනාටම ආයුබෝවන්.

නිමි